


ඔවිඳි උන්හසි

# කාචවර ගෙදර

**ISBN 978 – 624 – 208 – 398- 8**

ප්‍රකාශිත දිනය 2025-02-08

**කතෘගේ වෙනත් කෘති**

| | |
|---|---|
| ඇස් ජෝන්නැති කුඹි රාල | ISBN 978-624-206-736-0 |
| මලී | ISBN 978-624-206-736-7 |

**ඔවිඳි උන්හසි**

# පිදුම

මගේ ආදරණීය දෙමව්පියන්ටත්

ගුරුහරුකම් ලබාදුන්

ගුරු මෑණියන්ටත්

ආදරණීය විදුහල් මාතාවටත්

මේ පොත ආදරයෙන්

පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපිපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එකෝමත් එක කැලෑවක පුංචි ගෙයක් තිබුණා. ඒ ගෙදර සිටියා පුංචි ගැහැණු ළමයි දෙදෙනෙක් සහ පුංචි පිරිමි ළමයෙක්.



එක දවසක් ඒ පුංචි ළමයි තුන්දෙනා කැලෑවට ගියා. මේ තිදෙනාට ඇහුනා කැලෑවේ ඇතුලෙන් ශබ්දයක්.  ඒ හඬ ඇසුණු පැත්තට මේ ළමයි තුන්දෙනා ගියා.



මේ තිදෙනා දැක්කා ඈතින් පුංචි ගෙයක්. මේ ගෙදර ළඟට යද්දි එකපාරටම ඒ ගෙදර දොර ඇරුණා.



එයාලා ඇතුලට ගියා. ඇතුලේ සිට වයසක ආච්චි කෙනෙක් ආවා.

ඒ ආච්චි රූපය වෙනස් කරගත්තා. මේ තිදෙනාගෙන් ඒ ආච්චි ගෙදර වැඩ කරගත්තා.




මව සහ පියා නැතිව දරුවන් තිදෙනා බොහෝ සේ දුකට පත්වුණා.

මේ ගෙදර ඇතුලේ තවත් ළමයි සිරකර සිටින බව මේ තුන්දෙනා දැක්කා.

මේ ගෙදරින් පැන යන්න ක්‍රමයක් දරුවන් තිදෙනා කල්පනා කරා.


මේ ගෙදර සිටිය නපුරු ආච්චි රෝස මල් වලට හරිම බයයි. අපි හැමෝම රෝස මල් වාගේ,ලස්සන මල් වගේ නේද? ආච්චි නම් ඒ මල් වලට බයයි.





මේ බව දැනගත් පුංචි ළමයින් තිදෙනා ඒ නපුරු ආච්චිගේ හිස පීරන්න පටන් ගත්තා.

පුංචි ගැහැණු ළමයින් දෙන්නා ලස්සනට පීරන අතර පිරිමි ළමයා කැළයෙන් හොරෙන් ගෙන ආ රෝස මල ආච්චිගේ හිසේ ගසන විටම නපුරු ආච්චි සමගම ඒ කළුවර ගෙදර අතුරුදහන් වුණා.



ඉන් පසුව අනිත් යාළුවන්ද බේරාගෙන නපුරු ආච්චිගේ
ගෙදරින් පැන ගියා.

ඔවුන්ගේ නිවෙස් වල දෙමව්පියෝ මේ ළමයින් තිදෙනාට ප්‍රශංසා කළා.

එදා සිට මේ ළමයින් කවදාකවත් ඒ කළුවර කැලෑවට නම් ගියේ නෑ.



දෙමව්පියන්ට නොදන්වා ගමන් යෑම නරක පුරුද්දක් බව ඔවුන් තේරුම් ගත්තා.

නිමි



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ සැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබිදි උන්හසි දියණියනි, ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

**ISBN 978 – 624 – 208 – 398- 8**